# <u>විශේෂ නිවේදනයයි.</u>

**ඊශ්‍රායලයේ වාසය කරන සියලුම ශ්‍රී ලාංකික ප්‍රජාව වෙත,**

## <u>ඊශ්‍රායල් බලධාරීන් විසින් වීසා බලපත්‍ර දීර්ඝ කිරීම.</u>

**ඊශ්‍රායලයේ** කොරෝනා වෛරසයේ ව්‍යාප්තිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් මීට පෙර පල කරන ලද නිවේදන වලට වැඩිමනත් වශයෙනි.

ඊශ්‍රායල් බලධාරීන්ට අනුව, ඊශ්‍රායලයේ තහවුරු කරන ලද කොරෝනා රෝගීන් සංඛ්‍යාව 705 දක්වා මේ වන විට වැඩි වී ඇත (2020 මාර්තු 20 දින සවස් භාගයේ).

කොරෝනා වෛරස් වසංගත තත්වය සහ එය පැතිරීම වැළැක්වීම සඳහා දැනට පනවා ඇති සීමාවන් හේතුවෙන් **2020** මාර්තු **12** සිට කල් ඉකුත් වන පහත දැක්වෙන කාණ්ඩ වලට අයත් වීසා බලපත්‍ර **2020** ජුනි **30** දක්වා ස්වයංක්‍රීයව දීර්ඝ වන බව ඊශ්‍රායලයේ ජනගහන, ආගමන සහ දේශසීමා පාලන අධිකාරිය (PIBA) විසින් දන්වා ඇත.

1. රැකියා වීසා (B 1)
2. ආපසු පැමිණීමේ අයිතිය යටතේ සුදුසුකම් ලබන (A 1)
3. සිසුන් / පුහුණුවන්නන් / සීමාවාසිකයින් (A 2)
4. ආගමික ප්‍රජාව (A 3)
5. ඉහත A 3 සහ A 2 හි සඳහන් වීසා බලපත්‍ර හිමියන් හා කැටුව යන්නන් (A 4)
6. තාවකාලික පදිංචිකරුවන් (A 5)

මෙම වීසා බලපත්‍ර කල් ඉකුත්ව ඇති ඕනෑම අයෙකුට ජනගහන, ආගමන සහ දේශසීමා පාලන අධිකාරී (PIBA) කාර්යාල වෙත යෑමට අවශ්‍ය නොවේ. <u>ඉහත නිදහස් කිරීම වලංගු වන්නේ ප්‍රකාශිත දිනය වන **2020** ජුනි **30** දක්වා පමණක් බව කරුණාවෙන් සලකන්න.</u>

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
ටෙල් අවිව්, ඊශ්‍රායලය.

20.03.2020